**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

| | | | |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල | (ජ) | රිදීගම |
| (ආ) | පන්නල | (ණ) | මල්ලවපිටිය |
| (ඇ) | වාරියපොල | (ත) | මාස්පොත |
| (ඈ) | ඉබ්බාගමුව | (ද) | බිංගිරිය |
| (ඉ) | ගනේවත්ත | (ධ) | නාරම්මල |
| (ඊ) | මහව | (න) | පොල්පිතිගම |
| (උ) | ගිරිබාව | (ප) | ගල්ගමුව |
| (ඌ) | අඹන්පොල | (බ) | ඇහැටුවැව |
| (එ) | පඩුවස්නුවර (බටහිර) | (භ) | නිකවැරටිය |
| (ඒ) | පඩුවස්නුවර (නැගෙනහිර) | (ම) | කොබෙයිගනේ |
| (ඔ) | කුලියාපිටිය (බටහිර) | (ය) | රස්නායකපුර |
| (ඕ) | කුලියාපිටිය (නැගෙනහිර) | (ර) | කොටවෙහෙර |
| (ක) | අලව්ව | (ළ) | වීරඹුගෙදර |
| (ග) | මාවතගම | (ල) | බමුණාකොටුව |
| (ච) | පොල්ගහවෙල | (ව) | උඩුබද්දාව |

**1.1 විගණන විෂය පථය**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත් ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූනි 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ සහ ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,564.46 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු. මිලියන 1,559.77 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 4.69 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.30 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,202.21 | 1,200.39 | 1.82 | 0.15 |
| මූලධන | 362.25 | 359.38 | 2.87 | 0.79 |
| **එකතුව** | **1,564.46** | **1,559.77** | **4.69** | **0.30** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 21 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 8,261.17 ක් හා රු.මිලියන 4,330.80 න් වශයෙන් එකතුව රු.මිලියන 12,591.97 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 5,697.71 ක් හා රු.මිලියන 4,266.28 ක් වශයෙන් එකතුව රු.මිලියන 9,963.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.මිලියන 2,563.46 ක් හා රු.මිලියන 64.52 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,627.98 ක් හෙවත් ලබා දි තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 31.03 ක් හා සියයට 1.49 කින් ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27201 | 80.00 | 78.51 | 75.00 | 67.54 | 323.00 | 272.32 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 916.09 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ

වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.19 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

## 3. ශීර්ෂ 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| (iii) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845 (1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය | පවත්වා නොතිබුණි |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි |
| (v) | හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි |
| (vi) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |

### 3.2 සීමා නොපිළිපැදීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ අවම සීමාව ලෙස රු.75,000,000 ක් පාර්ලිමේන්තුව විසින් නියම කර තිබුණත්,

සමාලෝචිත වර්ෂය අවසානයට රු.67,545,331 ක් රැස්කර තිබීම නිසා රු.7,454,669 කින් සීමාව කරා ළගා වී නොතිබුණි.

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 10 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.2,616,895 ඉක්මවා රු.420,347 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ එකතුව රු.196,188 ක් වූ වියදම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු රු.92,500 ක ප්‍රතිපාදන උපයෝජන නොකිරීම නිසා එම ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) අමාත්‍යාංශ 20 ක් හා දෙපාර්තමේන්තු 07 ක් විසින් සපයා තිබූ ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 5 කට වඩා ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 916,092,649 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. 17,187,207 ක්වූ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ඉක්ම වූ ගම නැගුම හා විමධ්‍යගත අයවැය යටතේ මිලදී ගැනීම්වලට අදාල

රැඳවුම් මුදල් රු. 1,009,306 ක් අපේක්ෂිත කාර්යයන් ඉටු නොකර දිගු කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හර ශේෂය තුළ රු.378,625 ක සාවද්‍ය හර කිරිමක් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2014 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රජයේ නිලධාරින්ට ණය ගෙවිම සඳහා රු.2,505,000 ක් ලබාදී තිබුණ අතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.2,764,465 ක් ණය ගෙවීම නිසා රු.259,465 කින් එම සිමාව ඉක්මවා ණය ගෙවා තිබුණි.

(ඇ) 2004 ජුනි 30 දින හා 2011 අප්‍රේල් 08 දින මිය ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අය විය යුතු පිළිවෙලින් රු.211,130 ක් හා රු.3,500 ක් වශයෙන් එකතුව රු. 214,630 ක් ණය ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් පියවා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක නිලධාරින් 09 දෙනෙකු විශ්‍රාම ලබා වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, එම නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.245,736 ක ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේ වැඩ තහනමට ලක්ව සිටි මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.53,187 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේ සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. තවද 2014 පෙබරවාරි 03 දින සේවය හැර ගිය බවට වාර්තා කර තිබුණු නිලධාරියකු නමින් ඉහත ණය ශේෂය ගිණුමේ දක්වා තිබුණි. මෙම ණය මුදල් එකම නිලධාරියාගේද යන්න තහවුරු කර ගැනිමට නොහැකි විය.

(ඊ) ඉදිරිපත් කරන ලද ලේඛන අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ වර්ෂ අවසාන ශේෂය රු.272,849,772 ක් වූවද, භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු. 272,322,431 ක් වූයෙන් රු. 527,341 ක වෙනසක් පැවැතුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.6.1 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2014 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 03 ක් පවත්වා තිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| වත්කම් වර්ගය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| ඉඩම (හෙක්ටයාර) | අලව්ව | 01 (ඒකක ගණන නොදැක්වේ. ප්‍රා.ලේ. නිල නිවාස පිහිටි ඉඩම) | වසර 14 ක් පමණ |
| ගොඩනැගිලි | අලව්ව | ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිල නිවස | වසර 14 ක් පමණ |
| | පඩුවස්නුවර බටහිර | ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිල නිවස | වසර 05 ක් පමණ |
| මෝටර් වාහන | ගල්ගමුව | යතුරු පැදිය<br>කැබ් රථය | වසර 01 ක් පමණ<br>වසර 1 ½ ක් පමණ |
| | ඉබ්බාගමුව | යතුරු පැදිය | වසර 02 ක් පමණ |
| | බමුණාකොටුව | යතුරුපැදිය | වසර 07 ක් පමණ |
| | ගිරිබාව | කැබ් රථය | වසර 01 ක් පමණ |
| | | යතුරු පැදිය | වසර 06 ක් පමණ |
| විදුලි උපකරණ, පරිගණක | පඩුවස්නුවර බටහිර | පැනසොනික් වර්ගයේ රූපවාහිනී 01 ක් සහ පරිගණක උපාංග 06 ක් | වසර 03 ක් පමණ |
| | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය | රු.1,017,790 ක් වටිනා වීඩියෝ කැමරාව හා උපාංග | වසර 01 කට ආසන්න |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2015 මාර්තු 17 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් නිල නිවාසයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා 2015 ජූනි 19 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii). වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විෂයයන් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 772 ක ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii). 2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීමේදී නාරම්මල, පොල්පිතිගම, බිංගිරිය, කොබෙයිගනේ, වීරඹුගෙදර, අඹන්පොල, පඩුවස්නුවර (නැගෙනහිර), ගනේවත්ත හා පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වට්ටෝරු භාණ්ඩ ලේඛන නිවැරදිව සකස් කර තිබුණත්, තථ්‍ය ශේෂයන් ගණනය කිරීමේදී එම භාණ්ඩවල අයිතිය පළාත් සභාවටද, මධ්‍යම රජයටද යන්න හඳුනා ගැනීමට අපහසු වී තිබුණි.

(iv). බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල රථය පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණද, එය කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බඩු වට්ටෝරු ලේඛනයේ ඇතුළත් කර තිබුණි.

(v). බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම්ගේ නිල වාහන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(vi). ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අදාලව 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීමේදී විෂයයන් 764 ක් සඳහා භාණ්ඩ සහ උපකරණ 2391 ක ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස දක්වා තිබුණද, වසර ගණනාවක් තිස්සේ අභාවිතව පවතින මෙම භාණ්ඩ ඉවත් කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.8** **අනුකූල නොවීම**

**-------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XIX වැනි පරිච්ඡේදයේ 5.4.1 වගන්තිය | 38,210 | ඉබ්බාගමුව සහකාර ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් හා කලත්‍රයාගෙන් අයවිය යුතු නිල නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 237(ආ) | 57,877 | කුලියාපිටිය දැයට කිරුල ප්‍රදර්ශණය සඳහා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ලබාගත් වැලි කියුබ් 3.6 ක් සහ කොන්ක්‍රීට් ගල් කියුබ් 5.25 ක් අදාල තොග පොත්වලට ඇතුළත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 264 | 129,605,403 | දැයට කිරුල ප්‍රදර්ශණය වෙනුවෙන් කරන ලද ගෙවීම් 47 ක් සඳහා විධිමත් පරිදි අනුක්‍රමික අංක යෙදූ කුවිතාන්සිපත් වවුචරයට අමුණා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 341 | 54,688 | ගල්ගමුව සහ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල උප පත්‍රිකා පොත් පාලනය, ලේඛන පවත්වාගෙන යාම, නිකුත් කිරීම සහ |

| | | | |
|---|---|---|---|
| | | | ආපසු භාරදීම, ගබඩා පොත් හා ඉන්වෙන්ට්‍රි ලේඛනවල භාණ්ඩ ලැබීම් සහ නිකුත් කිරීම් නිවැරදිව සටහන් කිරීම යනාදිය විධිමත්ව සිදුකර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 371 | 11,360,140 | ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්ය නිම කළ වහාම පියවිය යුතු වූවත්, දැයට කිරුල ප්‍රදර්ශණය වෙනුවෙන් අවස්ථා 09 කදී එකතුව රු.11,317,990 කද, අඹන්පොල සහ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් අවස්ථා 03 කදී රු.10,000 කද, අවස්ථා 04 කදී රු.32,150 ක්ද ලබාදී තිබුණු අත්තිකාරම් පියවා නොතිබුණි. එමෙන්ම අත්තිකාරම් ලබාගත් ආයතනය විසින් බිල්පත්ද ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 540(2), (3) සහ 541 | 12,610 | ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුදල් බැංකුගත කිරීම හා දෛනික ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් නොතිබුණි. එම හේතුවෙන් මුදල් භෞතික පරීක්ෂාවේදී සරප් භාරයේ රු.12,610 ක අතිරික්ත මුදලක් පැවැතුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 1645(ආ) හා 1646 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහන දෙකකද, ගල්ගමුව, මහව, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංචිත වාහනවලද දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**-------------------------------**

| | | | |
|---|---|---|---|
| (i). | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ඒ යටතේ පවතින විවිධ අංශවල වාහන 13 ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක වාහනවල මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |
| (ii) | 2008 ජුනි 26 දිනැති 13/2008 දරන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම්වරයා විසින් භාවිතා කර තිබුණු නිල රථයට අමතරව කාර්යාලයේ සංචිත වාහනයද රාජකාරි සඳහා යොදවා ගෙන තිබුණි. |
| (iii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | - | වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |

**(ඈ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ**

**-------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | 2009 දෙසැම්බර් 15 දිනැති අංක වි/වැ 2006 දරන චක්‍රලේඛය | - | • මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුද්ගලයින් තිදෙනෙකුගෙන් ජීවත් වන බවට සහතික ලබා නොගෙන මාස 08 ක් මුළුල්ලේ විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.<br>• 2014 අගෝස්තු මාසය දක්වා වන කාලය තුළ මිය ගිය විශ්‍රාමිකයින් 34 දෙනෙකුගෙන් 17 දෙනෙකුගේ මරණය සනාථ කිරීමට අවශ්‍ය ග්‍රාම නිලධාරී සහතික ලබා ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2011 ජූනි 30 දිනැති අංක 05/2011 දරන චක්‍රලේඛය | 21,125 | ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයකුට විදේශගතවූ 2013 අගෝස්තු 05 දින සිට 2014 ඔක්තෝබර් මාසය දක්වා කාලය සඳහා ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඉ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2014 අප්‍රේල් 02 දිනැති අංක MED/5/RD/4 දරන චක්‍රලේඛයේ 6 ඡේදය | 720,394,506 | 2014 වර්ෂයට අදාලව කළ යුතු අතරම, 2014 වර්ෂයේදී අදාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව අවධාරනය කර තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ට අදාලව ව්‍යාපෘති 1,416 ක් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්වැලෙහි සඳහන් උපදෙස් අනුව එම එම ව්‍යාපෘති 2014 වර්ෂයේදි ක්‍රියාත්මක කළ යුතු වුවත්, එසේ නොකර එම ව්‍යාපෘති ඉදිරි වර්ෂය සඳහා අවිච්ඡේද කර තිබුණි. |

**3.9 දේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

-------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් විසින් එකතුව රු.183,644,452 ක් වියදම් කර නිම කිරීමට සැලැසුම් කර තිබුණු ව්‍යාපෘති 493 ක් විවිධ හේතු දක්වමින් ආරම්භ කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 විසින් එකතුව රු.668,760,214 ක් වූ ව්‍යාපෘති 860 ක් නියමිත කාලවකවානු තුළ නිම කර නොතිබුණි. එම ව්‍යාපෘති නිම කිරීමේ කාල ප්‍රමාදය මාස 01 සිට මාස 06 ක කාලපරාසයක් ගෙන තිබුණි. ව්‍යාපෘති නිම නොකිරීමට විවිධ හේතු දක්වා තිබුණද එම හේතු සනාථ කර ගැනීමට වූ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැයට කිරුල සංවර්ධන වැඩසටහන යටතේ ජල ව්‍යාපෘති තුනක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.23,727,448 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවා තිබුණද, ජල ව්‍යාපෘතිවල කිසිදු ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

(ii). 2014 වර්ෂයට අදාල විදුලි යෝජනා 60 ක් සඳහා එකතුව රු.19,817,582 ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 කට අදාලව එකතුව රු.5,941,798 ක් වටිනා විදුලි යෝජනා ක්‍රම 15 ක පමණ ප්‍රමාණයක වැඩ අවසන් කර ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු අධීක්ෂණයක් හෝ පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

(iii). රිදීගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ රු.1,816,719 ක ඇස්තමේන්තුවක් යටතේ නැලවුල්ල ගමට යන මාර්ගය කොන්ක්‍රීට් කර තිබූ අතර, ඒ සඳහා රු.1,626,814 ක් ගෙවා තිබුණි. මාර්ගයේ දික් අඩි 60 ක පමණ කොටසක් පුපුරා ඇතුළට කඩා වැටී තිබුණි. මෙම කොටස අධික බෑවුමකින් යුක්තවන බැවින් එයට සුදුසු ආකාරයට වැරගැන්වූම් යෙදීමට ඇස්තමේන්තු කර නොතිබූ අතර, කඩා වැටී තිබූ කොටස ඇස්තමේන්තුවට අනුව 1:3:6 (මි.මී. 40) මිශ්‍රණයෙන් යුතුව නියමිත ප්‍රමිතියට සකස් කර නොතිබුණි.

## 3.10 කාර්යසාධනය

2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණ අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i). බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "ගම නැගුම 2014 එක් ගමකට එක් වැඩක් වැඩසටහන" යටතේ සිදුකළ රු.443,428 ක් වටිනා

ඉදිකිරීම් කර්මාන්ත දෙකක් නියමිත පරිදි ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. "පළාත් නැගුම 2014" යටතේ වූ රු.1,273,656 ක් වටිනා ඉදිකිරීම් කර්මාන්ත දෙකක් ගිවිසුම් කාලය ඉක්මවීමට ප්‍රථම නිම කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). දිවි නැගුම ජාතික වැඩසටහන VI අදියර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය වෙනුවෙන් පොල් පැල 600,000 ක් බෙදා හැරීම සඳහා පොල් සංවර්ධන මණ්ඩලයට ගෙවීම සඳහා රු.60,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට පොල් පැළ 414714 ක් මිලදී ගෙන තිබුණු අතර එහි වටිනාකම වූ රු.41,471,400 කින් රු.23,830,600 ක් පමණක් ගෙවා තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.18,528,600 ක් උපයෝජනය කර නොතිබුණු අතර, මිලදීගත් පොල් පැල වෙනුවෙන් රු.17,640,800 ක් ගෙවා නොතිබුණි.

(iii). ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 5466 ක් සඳහා වූ පිරිවැයෙන් රු.135,458,278 ක් වටිනා වැඩ කොටස් අවසන් කර තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක් විසින් පමණක් අදාල උපකරණ ප්‍රතිලාභීන් වෙත බෙදා හැර තිබුණි. එහෙත් අදාල උපකරණ මිලදී ගත් ආයතන වෙත උපකරණ 3,629 ක් සඳහා වූ රු. 31,082,340 ක් ගෙවිය යුතුව තිබුණි.

(iv). ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ මිලදීගෙන බෙදීමට තිබූ රු.13,360,068 ක් වටිනා උපකරණ 1,739 ක් බෙදා නොහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ගබඩා කර තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

**----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**----------------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක් සඳහා ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

**3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 06 සිට වර්ෂ 01 ක් දක්වා කාල පරාසයට අයත් නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකළ රු. 4,233 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එම සැසඳුම් ප්‍රකාශයේ සඳහන් හඳුනානොගත් හර රු. 9,955 ක්ද, හඳුනා නොගත් බැර රු.20 ක්ද ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

**3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) "සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම" විසින් 1999 වර්ෂයේදී ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබුණු “කොරකහවත්ත” නැමැති ඉඩම සඳහා ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් විසින් 2005 වර්ෂයේදී රු.37,621,110 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා තිබුණි. එම ඉඩම 1999 වර්ෂයේ සිට වාර්ෂිකව රු.304,000 ක කුලී මුදලක් ගෙවීමට යටත්ව වසර 30 ක කාලයක් සඳහා "සීමාසහිත හිරියාල ගොවිජන සමාගම" වෙත බදුදී තිබුණු අතර, වර්තමානය වන විටද අක්කර 75 කින් යුත් එම ඉඩම සඳහා 1999 වර්ෂයේ සිට වාර්ෂිකව අයකරන බදු මුදල රු.304,000 ක් සිට වැඩි කිරිමට කටයුතු කර නොතිබුණි. මෙම ඉඩමේ පිහිටි රු.6,386,867 ක් පමණ වටිනා තේක්ක ගස් 111 ක් නිසි අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදී බිම හෙලා තිබුණු අතර, ඒ සඳහා අඩවි වන නිලධාරිගේද අනුමැතිය ලබාදී නොතිබුණි. එමෙන්ම අනවසරයෙන් බිම හෙලා තිබුණු තේක්ක ගස් වලින් ගස් 93 ක ප්‍රමාණය උපරිම වශයෙන් වසර 14 ක් පැරණි ඒවා බවත් ගස්වල වට ප්‍රමාණය නිවැරදි බවත් ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 472 දරන පොතුවිල වසමේ ග්‍රාම නිලධාරිණිය විසින් සහතික කර තිබුණත්, ඒ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) “දිවි නැගුම ජාතික වැඩසටහන” අදියර යටතේ පොල් සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් සඳහා රු.23,425,700 ක් වටිනා පොල් පැල 234,257 ක් ලබාදී තිබුණද, ප්‍රතිලාභීන් වෙත රු.14,087,100 ක් වටිනා පොල් පැළ

140871 ක් නිකුත් කර තිබුණු බැවින් රු.9,398,600 ක් වටිනා පොල් පැල 93,986 ක ප්‍රමාණයක් අදාල ප්‍රතිලාභීන් වෙත නිකුත් කර නොතිබුණි.

(ඈ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයාට වර්ෂයකට ලබාගත හැකි උපරිම ඉන්ධන ලීටර් ප්‍රමාණය 2700 ක් පමණක් වුවද, දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශයේ ඉන්ධන ඇනවුම් මඟින් ලබාගෙන තිබුණු ඉන්ධන ලීටර් 3675 ක් සමඟ 2014 වර්ෂය සඳහා ලබා ගෙන තිබුණු මුලු ඉන්ධන ලීටර් ප්‍රමාණය 6375 ක් වූ අතර එහි වටිනාකම රු.772,012 ක් විය. 2013 වර්ෂයේදී ලබාගත හැකි ඉන්ධන දීමනාවට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ හතරකින් වැඩිපුර ලබාගෙන තිබුණු ඉන්ධන ප්‍රමාණය ලීටර් 3188 ක් වූ අතර එහි වටිනාකම රු.383,124 ක් විය.

(ඇ) කුරුණෑගල දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂවරිය වෙත වෙන් කල වාහනය සඳහා හිමි ඉන්ධන සීමාව ලබා ගැනීමට අමතරව 2013 වර්ෂයේදී රු.54,810 ක් වටිනා ඉන්ධන ලීටර් 459 ක්ද, 2014 වර්ෂයේදී රු.34,756 ක් වටිනා ඉන්ධන ලීටර් 287 ක්ද ඉන්ධන ඇණවුම් මඟින් ලබාගෙන තිබුණි.

## 3.13 අවිධිමත් ගනුදෙනු

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුව අස්ථානගත වී තිබියදී, 2014 ඔක්තෝබර් මාසය සඳහා එම විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප් ගෙවීමේ නිවැරදිතාවය තහවුරු කර නොගෙන රු.23,900 ක් ගෙවා තිබුණි.

(ආ) ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකු සඳහා ජීවත්වන බවට සහතික ලබා නොගන විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(ඇ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා ණය ලබාදීම සම්බන්ධයෙන් කරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේදී අසම්පූර්ණ ගිවිසුම් මත නිලධාරීන් තිදෙනෙකුට රු.519,000 ක ආපදා ණය ගෙවා තිබුණි.

(ඈ) දැයට කිරුල ප්‍රදර්ශණය වෙනුවෙන් පවත්වන ලද පාපැදි තරඟ ජයග්‍රාහකයින් 41 දෙනෙකුට ගෙවූ රු.1,974,500 ක මුදල් භාරගත් බවට ජයග්‍රාහකයින් විසින්

ගෙවීම් වවුචර්වලට අත්සන් කිරීමක් හෝ කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමක් හෝ කර නොතිබුණි.

(ඉ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා රු.14,545,225 ක් වටිනා පරිගණක 155 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදනය සඳහා එහි තාක්ෂණික ඇගැයීමේ කමිටුවේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 මාර්ගෝපදේශය ප්‍රකාර එම විෂය සම්බන්ධ විශේෂඥයකු පත් කර නොතිබුණි. එසේම පුවරු මාදිලියේ (TAB) පරිගණකවල අවශ්‍යතාවය පිළිබඳව කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ඉල්ලීම් කර නොතිබුණු අතර, එම පරිගණක මිලදී ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කින් එම පරිගණක භාරගත් බවට තොග සහතිකද ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) කුරුණෑගල දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය සඳහා රු.1,017,790 ක් වැය කර වීඩියෝ කැමරාවක් සහ උපාංග මිලදී ගෙන තිබුණ අතර, ඒ සඳහා විධිමත් අධ්‍යයනයක් කර නොතිබුණි. වසරකට ආසන්න කාලයක් ඒ සඳහා වෘත්තීය නිපුනතාවය සහිත පුද්ගලයකු සොයාගත නොහැකි වීම හේතුවෙන් වීඩියෝ කැමරාව නිෂ්ක්‍රීයව පැවතුණි.

(උ) රජයේ කාර්යයන් සඳහා මිලදී ගැනීම්/ සේවා සැපයීම්වලදී භාණ්ඩ හා සේවා නියමිත පරිදි හා අවශ්‍ය පිරිවිතරයන්ට අනුකූලව සපයා ඇති බවට සෑහීමකට පත් වූ පසු ගෙවීම් කළ යුතු වුවත්, මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එම නියමයන්ට පටහැනිව සුහසාධක සමිති 09 ක් සඳහා මිලදීගත් භාණ්ඩ ලැබීමට පෙර රු.62,820 ක් ගෙවා තිබුණි.

## 3.14 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බදු ලෙජරය අනුව කොරකහවත්ත ඉඩම 1999 ජනවාරි 18 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වසර 16 ක කාලයක් සඳහා බදු දීම වෙනුවෙන් රු.6,406,140 ක් අයකර ගෙන තිබුණද, තවදුරටත් අයවිය යුතුව පැවති රු.19,213,504 ක ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(ආ) උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක් අනතුරකට ලක්වීමෙන් සිදුවූ රු.114,650 ක අලාභය 2015 මාර්තු 31 දින වන විටත් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ඇ) දැයට කිරුල ප්‍රදර්ශණ භූමියේ ආපනශාලා අංක 03 සහ අංක 04 සඳහා ලංසු ඉදිරිපත් කර නොතිබිම නිසා නැවත ලංසු කැඳවීමේදී 03 වන ආපනශාලාව සඳහා රු.350,000 ක ලංසුවක් පෞද්ගලික ආයතනයකින් ඉදිරිපත් කර තිබුණද, ප්‍රසම්පාදන කමිටුව විසින් එම ලංසුව ප්‍රතික්ෂේප කිරීම නිසා රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2008 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් විසින් ඉදිකර තිබූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණ පිහිටි ඉඩම එම සමාගමට දීර්ඝ කාලීන බදු ගිවිසුමක් යටතේ බදුදී නොතිබූ අතර, ඒ වෙනුවෙන් වසර 06 කට ආසන්න කාලයක් වෙනුවෙන් රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

(ඊ) මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සාරගම ජනාධිපති බාලිකා විද්‍යාලයට පානීය ජලය ලබාගැනීම සඳහා රු.693,825 ක පිරිවැය ඇස්තමේන්තුවකට ළිඳක් ඉදිකිරීමට කටයුතු කර තිබූ අතර, එය කඩා වැටීම හේතුවෙන් රු.227,097 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 3.15 අනාර්ථික ගනුදෙනු

වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ "පළාත් නැගුම 2014" වැඩසටහන යටතේ සිදුකළ උහුමීය අනුර ජනපදයේ පානීය ජල ව්‍යාපෘතියක් සඳහා රු.294,512 ක් වැය කර තිබුණත්, එම ව්‍යාපෘතිය අසාර්ථවීමෙන් වැය කළ මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

## 3.16 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) "දිවි නැගුම VI අදියර" යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක කරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේදී බෙදාදී තිබුණු පොල් පැලවලින් සියයට 30 ක සිට සියයට 40 ක් දක්වා ප්‍රමාණයක් බෙදා දී මාස 04 කටත් වැඩි කාලයක් ගතවී තිබුණත්, විධිමත් පරිදි පොල් සිටුවීමට ක්‍රියාකර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. සාර්ථක වගාවක් සඳහා මෙලෙස බිම් පොල් පැල ප්‍රවාහනය කර සතියක් ඇතුළත විධිමත් පරිදි පැල සිටුවිය යුතු වුවත්, එසේ කර ඇති බවට විධිමත් අධීක්ෂණයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකර නොතිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2013 නොවැම්බර් 18 දිනැති දිවි නැගුම ජාතික වැඩසටහන ලිපියේ 05 ඡේදයට අනුව බෙදා හරිනු ලබන පොල් පැල පිළිබඳව පසු විපරම් වාර්තා පිළියෙල කිරීමට නියමිත වූ නමුත් ප්‍රාදේශීය ලේකම් සහ එක් එක්

ග්‍රාම නිලධාරී වසම් භාර සංවර්ධන නිලධාරීන් විසින් පසු විපරම් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මල්ලියගොඩ සිට අකාඩේ දක්වා මාර්ගයේ අවශ්‍ය ස්ථානවල පැති බැම් ඉදිකර මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර 2014 අගෝස්තු 25 දින සිට 2014 නොවැම්බර් 25 දින දක්වා කාල සීමාව තුළදී ඉටුකිරීම සඳහා අකාඩේ එක්සත් ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදී තිබුණි. එහෙත් ඇස්තමේන්තු ප්‍රකාරව ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණයෙන්ම නිම නොකර තිබියදී කොටසක් පමණක් ඉටු කර ඒ සඳහා රු.305,196 ක් ගෙවා තිබුණු අතර, කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) උක්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිංහපුර පළමු පටුමගේ සිට වැලිගෙපොල පාරට වැටෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර 2014 ජුලි 15 දින සිට 2014 ඔක්තෝබර් 15 දින දක්වා කාල සීමාව තුළදී වැඩ අවසන් කිරීමට "අල්හම්රා ග්‍රාමීය සමෘද්ධි සමිතියට" භාරදී තිබුණි. එහෙත් ඇස්තමේන්තු ප්‍රකාරව ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණයෙන් නිම නොකර කොටසක් පමණක් ඉටුකර තිබියදී ඒ සඳහා රු.505,608 ක් ගෙවා තිබුණු අතර, කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.17 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ගල්ගමුව ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ නියැදි පරීක්ෂාවේදී අදාල කොන්ත්‍රාත්කරු හා ප්‍රාදේශීය ලේකම් විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 මාර්ගෝපදේශයට පටහැනිව සාවද්‍ය මිල ගණන් සඳහන් කරමින් ගිවිසුම්වලට එළඹ තිබුණි. ඒ පිළිබඳව අදාල පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) 2014 දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘති යටතේ කුරුන්දාව (ජාගම) සහ කවිටකඩුව පානීය ජල ව්‍යාපෘතියේ ජල ටැංකි ඉදිකර ඇති භූමි භාගය රජයට පවරා ගැනීමට අදාල පාර්ශවයන් විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටුවා වසර ගණනාවක් ගතවී තිබුණද, එහි භූමියේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ගෙන නොතිබුණි.

(ඈ) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "විමධ්‍යගත ආයෝජන 2014" යටතේ රු.34,450 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණත්, එම භාණ්ඩ ගබඩාවට

ලැබී නොතිබියදී ගබඩා ලේඛනවල ලැබීම් ලෙස ඇතුළත් කර තිබුණි. ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා මිලට ගනු ලැබූ රු.119,400 ක් වටිනා උපකරණ විෂයයන් 07 ක් මිලට ගෙන සැලකිය යුතු කාලයක් ගතවී තිබුණද විධිමත් පරිදි බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එක් එක් ප්‍රසම්පාදනය සඳහා වෙන වෙනම ලිපිගොනු පවත්වා ගැනීම වෙනුවට ප්‍රසම්පාදන ගණනාවක් සඳහා එක් ලිපිගොනුවක් පමණක් පවත්වා තිබුණ අතර, ඒවාට අදාල ලංසු කැඳවීම් සහ බැංකු ඇපකර අක්‍රමවත්ව තබා තිබුණි.

(ඊ) විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේදී 2012, 2013 සහ 2014 වර්ෂවලදී අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නොගෙවූ විශ්‍රාම වැටුප් ක්‍රමවත්ව ලේඛනගත කර නොතිබුණි.

(උ) අඹන්පොල සහ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් අක්කර 1 ½ ක් සහ අක්කර 03 ක ඉඩම්වල කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ගේ ශීර්ෂයෙන් වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණද, අවම වශයෙන් මිනුම් කටයුතු කර මායිම් ලකුණු කිරීම පවා සිදුකර නොතිබුණි.

(ඌ) මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ ස්වේච්ඡා සංවිධානවලට ලබාදීම සඳහා මිලදී ගෙන තිබුණු එකතුව රු.33,250 ක් වටිනා ලීටර් 500 ජල ටැංකි 07 ක් සහ විහාරස්ථානයකට ලබාදීම සඳහා මිලදී ගෙන තිබුණු රු.9,440 ක් වටිනා වාද්‍ය භාණ්ඩ තොගයක් බෙදා නොහැර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(එ) ගිරිබාව හා අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වයස අවුරුදු 18 ට අඩු බාලවයස්කාර ගිණුම්හිමියන් පිළිවෙලින් තිදෙනෙකු හා දෙදෙනෙකුගෙන් බාලවයස්කාර ගිණුම්වලට අදාල පාස් පොත් නීත්‍යානුකූලව භාරදී නොතිබුණි.

(ඒ) වසර 2009/2010 කාලපරිච්ඡේදයේදී ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ ආයතනයක් විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ පරිපාලන කටයුතු ගිරිබාව ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණද, එකී ගොඩනැගිල්ලේ අයිතිය විධිමත්ව පවරා ගෙන නොතිබුණි.

(ඔ) ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වයස අවුරුදු 70 ඉක්ම වූ අසරණභාවයට පත් වූ වැඩිහිටියන් සඳහා මසකට රු.1,000 බැගින් ගෙවනු ලබන වැඩිහිටි දීමනාව

වැඩිහිටියන් 131 දෙනෙකු සඳහා වූ එකතුව රු.131,000 ක් වූ දීමනා නොගෙවීම සම්බන්ධයෙන් සමාජ සේවා නිලධාරීන් කිසිදු පසු විපරමක් සිදුකර නොතිබුණි.

**3.18 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අදාල තොරතුරුවලට අනුව සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 101 | 91 | 10 | - |
| (ආ) | තෘතීයික මට්ටම | 62 | 47 | 16 | 01 |
| (ඇ) | ද්වීතියික මට්ටම | 3,015 | 2,809 | 209 | 03 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 316 | 303 | 21 | 08 |
| (ඉ) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 03 | 08 | - | 05 |
| | **එකතුව** | **3,497** | **3,258** | **256** | **17** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 256 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තෘතීයික මට්ටමේ එක් නිලධාරියෙකුද, ද්වීතියික මට්ටමේ එක් නිලධාරියෙකුද, නාරම්මල, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද්වීතියික මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකුද, පඩුවස්නුවර (බටහිර), අලව්ව, ඇහැටුවැව, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 08 දෙනෙකුද, පඩුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෙනත් සේවකයින් 05 දෙනෙකුද, ඇතුළුව නිලධාරීන් 11 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව සේවයේ යොදවා තිබුණි.

(ඇ) බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී, පරිපාලන නිලධාරී, කාර්මික නිලධාරී සහ රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 11 ක් සහ ග්‍රාම නිලධාරී තනතුරු 07 ක් පුරප්පාඩුව පැවතුණි.

(ඈ) මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධව පිහිටුවා ඇති විදාතා මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්ෂණ නිලධාරී තනතුරු වසර 02 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණ අතර ඒ හේතුවෙන් එම කාර්යාලයේ ඉතා අධික වටිනාකමකින් යුත් උපකරණ රාශියක් නිෂ්ක්‍රීයව පැවතුණි.